# විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

NIA NATIONAL INNOVATION AGENCY

# ජාතික නව්‍යකරණ නියෝජිතායතනය

2019 අංක 22 දරන පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපිත කරන ලද ජාතික නව්‍යකරණ නියෝජිතායතනය (NIA), සුදුසු අධ්‍යාපනික සහ වෘත්තීය පසුබිමක් ඇති සහ නව්‍ය මානසිකත්වයකින් යුතුව වර්ධනය වීමට කැමැත්තක් ඇති සුදුසු පුද්ගලයන්ගෙන්, පහත තනතුරුවල සේවය කිරීමට අයදුම්පත් කැඳවයි.

## නව්‍යකරණ නිලධාරි AR 1

| | |
|---|---|
| **සුදුසුකම්** | අ) තනතුරට අදාළ ක්ෂේත්‍රයට අදාළ පරිදි විද්‍යා විෂය ධාරාවන්, ඉංජිනේරු, කෘෂිකර්ම හෝ සමාජ විද්‍යා විෂය ධාරාවන් පිළිබඳ වි.ප්‍ර.කො. සභාව විසින් පිළිගත් විශේෂ උපාධියක්<br>හෝ<br>ආ) අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සමඟ විද්‍යා විෂය ධාරාවන්, ඉංජිනේරු, කෘෂිකර්ම හෝ සමාජ විද්‍යා විෂය ධාරාවන් පිළිබඳ වි.ප්‍ර.කො. සභාව විසින් පිළිගත් සාමාන්‍ය උපාධියක්. |
| **වයස** | වයස අවුරුදු 22ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය |
| **තනතුරේ ස්වභාවය** | කොන්ත්‍රාත් පදනම මත වසර 2ක කාලයකට (වාර්ෂිකව අලුත් කිරීමේ පදනමෙන්) |
| **වැටුප් කාණ්ඩය** | AR 1 - 2025 (මූලික වැටුප + ජීවන වියදම් දීමනාව) රු.71,700+17,800 = 89,500.00 |
| **පුරප්පාඩු තනතුරු ගණන** | 01 |
| | |

## කළමනාකරණ සහකාර MA 1-1

| | |
|---|---|
| **සුදුසුකම්** | අ) එක් වරකදී විෂයයන් හයක් සඳහා පහත සඳහන් විෂයයන් ඇතුළුව විෂයයන් හතරක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව,<br>I. සිංහල/දෙමළ<br>II. ගණිතය<br>III. ඉංග්‍රීසි භාෂාව<br>G.C.E (සා.පෙළ) සමත්,<br>සහ<br>ආ) අ.පො.ස (උ/පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය දැනීම ප්‍රශ්න පත්‍රය හැර) සමත් වීම. |
| **වයස** | වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය |
| **තනතුරේ ස්වභාවය** | කොන්ත්‍රාත් පදනම මත වසර 2ක කාලයකට (වාර්ෂිකව අලුත් කිරීමේ පදනමෙන්) |
| **වැටුප් කාණ්ඩය** | MA 1-1 2025 (මූලික වැටුප + ජීවන වියදම් දීමනාව) රු.40,403 + 17,800 = 58,203.00 |
| **පුරප්පාඩු තනතුරු ගණන** | 02 |

- සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා කායික හා මානසික වශයෙන් සුදුසු විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- පත්වීම් බලධාරියා විසින් පත් කෙරෙන මණ්ඩලයකින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවාගනු ලැබේ.
- මෙම තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත වසර 2ක කාලයකට (වාර්ෂිකව අලුත් කිරීමේ පදනමෙන්) බඳවා ගැනෙන අතර සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතවේ.
- මේ සඳහා උනන්දුවක් දක්වන අයදුම්කරුවන්, සත්‍ය බවට සහතික කළ උප්පැන්න සහතිකයේ සහ වෙනත් අදාළ සහතික සහ සේවා ලිපි වල ස්කෑන් පිටපත් සමඟ තමන් පිළිබඳ විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්ද සහිතව තමා අත්සන් කළ අයදුම්පත්, **"ප්‍රධාන නව්‍යකරණ නිලධාරි, ජාතික නව්‍යකරණ නියෝජිතායතනය, 3 වන මහල, සෙත්සිරිපාය I අදියර, බත්තරමුල්ල"** ට යොමු කර, ඉල්ලුම් කළ තනතුර "විෂයය" කොටුවේ සඳහන්කර, විද්‍යුත් තැපැලෙන් hr@nia.gov.lk වෙත, **2025 අගෝස්තු 7** හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතු ය.
- රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
- අදාළ විස්තර සහ සහතික පිටපත් නොමැති සියලුම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ
- ඕනෑම ආකාරයක අනිසි බලපෑම් සහ අනුග්‍රාහකත්වය අපේක්ෂා කිරීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වනු ඇත.


**ප්‍රධාන නව්‍යකරණ නිලධාරි,**<br>
**ජාතික නව්‍යකරණ නියෝජිතායතනය,**<br>
**3 වැනි මහල, සෙත්සිරිපාය I අදියර, බත්තරමුල්ල.**<br>
**දුරකථන: 94 11 3661205/94 11 3661201 ෆැක්ස්: 94 11 2875935**<br>
**විද්‍යුත් තැපෑල: hr@nia.gov.lk**